# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2022.08.17

වර්ෂ 2022 ක් වූ අගෝස්තු මස 17 වන බදාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ අගෝස්තු මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගී වූ ගරු සභිකවරු**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ජ්. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
08. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
10. ගරු මන්ත්‍රී ජේ.ජ්. චන්ද්‍රකුමාර මැතිතුමා
11. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
12. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
13. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
14. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
15. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් මහා සභා රැස්වීමේ වාර්තා තබන ලදී.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම ඃ-**

**01. 2022-07-20 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2022-07-20 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

2022-07-20 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ජේ.ජ්. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2022-07-20 වන දින පැවති මහා සභා රැස්වීමේදී ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා හට නිවාඩු අනුමත කිරීමට ඉල්ලීමක් කළද එය සභා වාර්තාවේ අන්තර්ගත වී නොමැති බවට ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම ඉල්ලීම යෝජනාවක් ලෙස ඉදිරිපත් නොවීම නිසා සහ ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා හට නිවාඩු අනුමත කිරීමට කිසිදු ගරු මන්ත්‍රීවරයෙකු විසින් ස්ථිර කිරීමක් සිදු නොකළ බැවින් එය 2022-07-20 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාවට ඇතුළත් කර නොමැති බවත්, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් විධිමත් පරිදි නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව විදෙස්ගත වී ඇති බවත්, අද දිනය වන විට මාස තුනක කාලයක් සභාවේ කිසිදු රැස්වීමක් සඳහා ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සහභාගි වී නොමැති බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

2022-07-20 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාවේ 09 පිටුවේ සඳහන් "අවසන් මිනුම් ලබාගෙන ගෙවීම් සිදුකර මාස තුනක් යනතෙක් 10%ක මුදල හා බැංකු ඇපකරය නිදහස් කරන බවට ගරු සභාපති දිල්රුක්

එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී." යන ප්‍රකාශය "අවසන් මිනුම් ලබාගෙන ගෙවීම් සිදුකර මාස තුනක් යනතෙක් 10%ක මුදල හා බැංකු ඇපකරය නිදහස් නොකරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී." ලෙස සංශෝධනය වීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2022-07-20 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

(පෙ.ව. 09.45ට ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය, පෙ.ව. 09.50ට ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය , පෙ.ව 09.55ට ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සහ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන ඃ-**

පසුගිය සභා වාරයකදී සභාව දැනුවත් කළ පරිදි අප ප්‍රාදේශීය සභාවේ කලේගාන ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ ලංකා විදුලි බල මණ්ඩලය විසින් ට්‍රාන්ස්පෝමරයක් ඉදිකිරීමට කරන ලද ඉල්ලීම අනුව සභාවේ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම පිණිස ලංකා විදුලි බල මණ්ඩලයේ සැලසුම් නිලධාරි මහතෙකු පැමිණ සිටින බැවින් එතුමා හට සභාව දැනුවත් කිරීම සඳහා කාරක සභා අවස්ථාවක් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**කාරක සභා අවස්ථාව**

කාරක සභා අවස්ථාවේදී ලංකා විදුලි බල මණ්ඩල නියෝජනය කරමින් පැමිණි සැලසුම් නිලධාරි මහතා විසින් පහත අදහස් දක්වා සිටින ලදී.

- මේ වන විට කලේගාන ප්‍රදේශයට විදුලි බලය ලබාදෙනු ලබන්නේ මිහිඳු මාවතේ පිහිටි ට්‍රාන්ස්පෝමරය හරහා බවත්, එහි වෝල්ටීයතාවය දැනට ප්‍රමාණවත් නොවන බව
- විදුලි බල මණ්ඩලය භාවිතා කරනු ලබන මෘදුකාංගය හරහා පරීක්ෂා කිරීමෙන් අනතුරුව කලේගාන ප්‍රධාන කාර්යාලයේ වක්වැල්ල මාර්ගයට රිසවේෂන් වෙන්කර ඇති කොටසේ ට්‍රාන්ස්පෝමරයක් ඉදිකිරීම සඳහා තෝරාගත් බව
- නව ට්‍රාන්ස්පෝමරයක් ඉදිකිරීම මගින් කලේගාන ප්‍රදේශයේ පවතින අඩු වෝල්ටීයතාවය මග හැරෙන බවත්, මෙම ව්‍යාපෘතියේදී නව බන්ඩල් වයර් යොදා ගන්නා බවත්, මෙම ව්‍යාපෘතිය සඳහා ලංකා විදුලි බල මණ්ඩලය රුපියල් මිලියන 6.5ක මුදලක් වැය කිරීමට බලාපොරොත්තු වන බව
- මේ සඳහා 10'x10' ප්‍රමාණයේ ඉඩක් අවශ්‍ය බවත්, අඩි 10ක උසකින් ට්‍රාන්ස්පෝමරය සවිකරන බව

මීට අමතරව ගරු මන්ත්‍රීවරුන්ට මෙම ව්‍යාපෘතිය සම්බන්ධව ඇති ගැටළු සාකච්ඡා කරන ලද අතර ට්‍රාන්ස්පෝමරය ඉදිකරන භූමිය දැල් වැටකින් ආවරණය කරදීම සහ ඉදිරි සංවර්ධන කටයුත්තකදී මෙම ට්‍රාන්ස්පෝමරය වෙනත් ස්ථානයකට සවිකිරීමට සිදු වුවහොත් මුදල් ගෙවීමකින් තොරව එම කාර්යය ලංකා විදුලි බල මණ්ඩලය විසින් සිදු කළ යුතුය යන කොන්දේසි වලට යටත්ව මෙම ව්‍යාපෘතියට අවසර ලබාදීමට මහා සභාව විසින් තීන්දු කරන ලදී.

කාරක සභා අවස්ථාව අවසන් කිරීමට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

නව අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාහට ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් සුභාසිංශන පිරිනමන ලදී.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ- නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**01.** වටරැක නැගෙනහිර, පහලගෙවත්ත, රුවන් පුෂ්පකුමාර මහතාගේ නිවස අසළ මාර්ගය හියුම් පයිප්ප යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ස්ථානයේ ට්‍රම්ප් එකක් යොදා ඇති නිසා වැසි දිනවලදී වතුර පාර මැදින් ගලා යාම නිසා පාර වතුරෙන් යටවීම වැළැක්වීම සඳහා හියුම් පයිප්ප යොදා සංවර්ධනය කිරීමට යෝජනා කළ බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ៖-** එකී යෝජනාවට අදාළව වටරැක නැගෙනහිර, පහලගෙවත්ත, රුවන් පුෂ්පකුමාර මහතාගේ නිවස අසළ මාර්ගය හියුම් පයිප්ප යොදා සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.** උළුවිටිකේ, 04 කණුව ඇතුල් මාර්ගය ඉදිරියේදී සංවර්ධනය කිරීමට යෝජිත මාර්ගයක් බැවින් පොදු ජල නලය යෙදීමේදී මාර්ගය පළුදු කිරීම මුදල් අයකර ගැනීමකින් තොරව සිදුකිරීම සඳහා අවසරය ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මාර්ගය පවුල් 10කට වැඩි ප්‍රමාණයක් භාවිතා කරන බවත්, මෙම ඉල්ලීම කරන ලද පාර්ශවය විසින් මෙම කටයුත්ත සභාවට මුදල් අයකර ගැනීමකින් තොරව සිදුකර දෙන ලෙස ඉල්ලීම් කොට ඇති බවත්, ජල නල එලීමෙන් අනතුරුව මාර්ගය ප්‍රතිසංස්කරණය කර ගැනීමේ කටයුතු අදාළ පාර්ශවය විසින් සිදු කර ගන්නා බවට දැනුම් දුන් බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මාර්ගය අළුත්වැඩියා කර ගැනීම අදාළ පාර්ශවය විසින් සිදු නොකළහොත් එය සභාව මගින් සිදු කිරීමට විය හැකි බවට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා සභාවට ගෙවීමකින් තොරව අදාළ කාර්යය සිදුකර ගැනීමට ඉල්ලීම් කළ බවත්, මාර්ගය පළුදු කරන ප්‍රමාණය ඔවුන් ප්‍රතිසංස්කරණය කර ගන්නා බවට දැනුම් දුන් බවත්, මෙම මාර්ගය මේ වන විට අබලන් තත්ත්වයේ පවතින බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙමගින් මාර්ගයට හානියක් නොවන පරිදි සහ සභාවට පාඩුවක් නොවන ලෙස සිදුකරනු ලබන්නේ නම් එය ගැටළුවක් නොමැති බවත්, වෙනත් ප්‍රදේශකින්ද මෙවැනි ඉල්ලීමක් පැමිණියහොත් ඒ සඳහාද මෙම අවසරය ලබාදීමට සිදුවන බවත් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

බල ප්‍රදේශයේ වෙනත් ප්‍රදේශයකින් මෙවැනි ඉල්ලීමක් පැමිණියහොත් මාර්ගයේ තත්ත්වය පිළිබඳව සලකා බලා එය තීරණය කරන බවත්, ඒ සඳහා තාක්ෂණ නිලධාරි වෙතින් නිර්දේශ ලබාගෙන එය සභාවට යොමුකර සභාවේ අනුමැතිය ලබා ගන්නා බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

නල ජලය ලබාදීම සඳහා පළුදු කරනු ලබන මාර්ග මේ වනතෙක් අළුත්වැඩියා කිරීම වසරක පමණ කාලයක සිට සභාව මගින් සිදු නොකළ බවට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ප්‍රීමික්ස් මිලදී ගැනීමට ඇති හැකියාව පිළිබඳව විමසා බැලුවද එය ලබා ගැනීමට නොහැකි වූ බවත්, මේ වන විට වෙළඳපොළ තුළ භූමිතෙල් හා තාරවල හිඟයක් බවතින බැවින් ප්‍රීමික්ස් නිෂ්පාදනය අඩාල වී ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කරන ලද මාර්ග පළුදුකොට නල ජලය ලබාදීමේදී, මාර්ගය පළුදු කරන පාර්ශවය වෙත සභාවේ අධීක්ෂණය යටතේ එම මාර්ග අළුත්වැඩියා කර ගැනීමට අවස්ථාව ලබා දිය යුතු බවට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මාර්ග පළුදු කිරීමේදී ඊට අදාළව සභාව වෙත ගෙවීම් කරන ලද මුදල් සභාව සතුව පවතින බැවින් ඉදිරියේදී ප්‍රීමික්ස් යොදා මාර්ග සංවර්ධනය කිරීමට නොහැකි වුවහොත් කොන්ක්‍රීට් යොදා හෝ එම මාර්ග අළුත්වැඩියා කිරීමට බලාපොරොත්තු වන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ප්‍රීමික්ස් නිෂ්පාදනය සභාවේ කම්කරුවන් යොදා සිදුකිරීම පිරිවැය අධික ක්‍රියාවක් වීම සහ, එසේ නිපදවන ප්‍රීමික්ස් වල ගුණාත්මකභාවය අඩු බැවින් යන්ත්‍රානුසාරයෙන් නිෂ්පාදනය කරනු ලබන ප්‍රීමික්ස් මිලදීගත යුතු බව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මාර්ග සංවර්ධන අධිකාරිය සතුව නිෂ්පානය කරන ලද ප්‍රීමික්ස් නොමැති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

තාර නිෂ්පාදනය කිරීමත් සමග ඉදිරියේදී පෞද්ගලික අංශය හරහා ප්‍රීමික්ස් මිලදී ගැනීමට හැකිවිය බවට ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කොන්ක්‍රීට් යොදා මාර්ග පළුදුකිරීම් අළුත්වැඩියා කිරීමේදී මාර්ගයේ වාහන ගමනාගමනය නිසා ප්‍රායෝගික ගැටළු පැමිණිය හැකි බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

වැවේවත්ත මාර්ගය සභාවේ අවසරයකින් තොරව අවිධිමත් ලෙස පළුදු කර නල ජලය ලබාදී ඇති බවත්, එම මාර්ගය මේ වන විට අදාළ පාර්ශවය විසින් සංවර්ධනය කොට ඇති නමුත් එය නිසි පරිදි සිදුකර නොමැති බවට ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

වැවේවත්ත මාර්ගයේ එම අළුත්වැඩියා කටයුතු නිසි පරිදි සිදුකොට නොමැති නම් ඒ සඳහා ඉදිරියේදී නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ලබා ගන්නා බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව උළුවිටිකේ, 04 කණුව ඇතුල් මාර්ගය ඉදිරියේදී සංවර්ධනය කිරීමට යෝජිත මාර්ගයක් බැවින් පොදු ජල නලය යෙදීමේදී මාර්ගය පළුදු කිරීම මුදල් අයකර ගැනීමකින් තොරව සිදුකිරීම සඳහා අවසරය ලබා දීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**03.** ගිංතොට, කුරුඳුවත්ත, ඉසුරු මාවතේ පදිංචි ඒ.ඩබ්.එම්. ජවුෆර් මයාගේ නිවස අසළ මාර්ගය නිවැරදි මායිමට තාක්ෂණ නිලධාරී පූර්ණ අධීක්ෂණය යටතේ කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට ඒ.ඩබ්.එම්. ජවුෆර් මයා හට අවසර ලබාදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ස්ථානයේ මාර්ගය පවතින ආකාරය වෙනස්කොට සංවර්ධනය කිරීමක් සිදුකළ යුතු බවත්, වැරදි ලෙස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කොට ඇති කොටස කඩා ඉවත් කොට මාර්ගය නිවැරදි මායිමට සංවර්ධනය කළ යුතු බවට සභාව දැනුවත් කරන ලද ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් මේ පිළිබඳව වැඩිදුරටත් තාක්ෂණ නිලධාරි හට සභාව දැනුවත් කිරීම සඳහා කාරක සභා අවස්ථාවක් බවට පත්කිරීමට කරන ලද යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි ඒ.පී.පී.එස්. ගුණසේකර මහතා විසින් පහත අදහස් දක්වා සිටින ලදී.

- මෙම අතුරු මාර්ගය අප ප්‍රාදේශීය සභාව මගින් සංවර්ධනය කොට ඇති බව
- ඒ ආසන්න ඉඩම මැනීමේදී මාර්ගය වැරදි ලෙස සංවර්ධනය කොට ඇති බව දැන ගන්නට ලැබුණ බව
- මෙම මාර්ගය දැනට පවුල් හයක් පමණ භාවිතා කරන බවත්, ඔවුන්ගේද එකඟතාවය ලබාගෙන මාර්ගය නිවැරදි මායිමට සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන බව

කාරක සභා අවස්ථාව අවසන් කිරීමට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ගිංතොට, කුරුඳුවත්ත, ඉසුරු මාවතේ පදිංචි ඒ.ඩබ්.එම්. ජවුෆර් මයාගේ නිවස අසළ මාර්ගය නිවැරදි මායිමට තාක්ෂණ නිලධාරී පූර්ණ අධීක්ෂණය යටතේ කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට ඒ.ඩබ්.එම්. ජවුෆර් මයා හට අවසර ලබාදීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**04.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 170 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් වැය ශීර්ෂයන් අතර මුදල් මාරු කිරීමට යෝජනා කරමි.

| උනතා වූ වැය විෂයන් | | | අතිරික්ත වූ වැය විෂයන් | | |
|---|---|---|---|---|---|
| වැය සංකේතය | වැය විෂය | වටිනාකම (රු.) | වැය සංකේතය | වැය විෂය | වටිනාකම (රු.) |
| 601-9 | වෙනත් දීමනා | 850,000.00 | 605-9 | වෙනත් වියදම් | 850,000.00 |
| 204-2 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තු | 600,000.00 | 205-9 | වෙනත් වියදම් | 600,000.00 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

වෙනත් දීමනා ලෙස වෙන්කොට ඇත්තේ කුමන අවශ්‍යතාවයන් සඳහා වෙන් කරන ලද මුදල් ද යනුවෙන් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

පෙර පාසල් ගුරුවරු සඳහා වැටුප් හා දීමනා ගෙවීමට වෙන් කරන ලද මුදල් මෙලෙස සේවා අවශ්‍යතාවය මත මාරු කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 170 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් වැය ශීර්ෂයන් අතර මුදල් මාරු කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

| උනතා වූ වැය විෂයන් | | | අතිරික්ත වූ වැය විෂයන් | | |
|---|---|---|---|---|---|
| වැය සංකේතය | වැය විෂය | වටිනාකම (රු.) | වැය සංකේතය | වැය විෂය | වටිනාකම (රු.) |
| 601-9 | වෙනත් දීමනා | 850,000.00 | 605-9 | වෙනත් වියදම් | 850,000.00 |
| 204-2 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තු | 600,000.00 | 205-9 | වෙනත් වියදම් | 600,000.00 |

**05.** නරාවල, සිට්ටුස්වත්තේ අප ප්‍රාදේශීය සභාව විසින් ඉදිකරනු ලබන ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීම සඳහා ගිවිසුම්ගත වූ ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනය විසින් ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ඉහළ යාම නිසා සහ ඉන්ධන සපයා ගැනීමට ඇති ගැටළු නිසා කර්මාන්තය සිදුකරගෙන යාමට නොහැකි බැවින් කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කරන ලෙස 2022-07-15 දිනැතිව කරන ලද ඉල්ලීම සලකා අදාළ කොන්ත්‍රාත් ගිවිසුම 2022-08-08 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති කමිටුවේදී (ටෙන්ඩර් කමිටුවේදී) අවලංගු කිරීමට තීරණය කළ බැවින් මෙම ද්විත්ව කුටීර අදාහනාගාරයේ ඉතිරි වැඩ කොටස් සඳහා නව මිල ගණන් යටතේ ඇස්තමේන්තු සකස්කර නැවත මිල ගණන් කැඳවා (RETENDER) අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමටත් මේ සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සකස්කිරීම, අධීක්ෂණ හා උපදේශන සේවාවන් නර්ඩ් ආයතනය හරහා ලබා ගැනීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙතෙක් සිදුකරන ලද වැඩ කොටස් සඳහා පෙර මිල ගණන් යටතේ ගෙවීම් සිදුකොට ඉතිරි වැඩ සඳහා ඇස්තමේන්තු සකස්කල යුතු බවට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනය විසින් රුපියල් ලක්ෂ හතලිහක පමණ බිල්පතක් ඉදිරිපත් කොට ඇති බවත්, එය තාක්ෂණ නිලධාරි, ඉංජිනේරුතුමා සහ නර්ඩ් ආයතනය විසින් අධ්‍යයනය කොට, අවශ්‍ය අඩු කිරීම් සිදුකිරීමෙන් පසු සිදුකොට ඇති කාර්යයන් සඳහා 10% රඳවුම් මුදල තබාගෙන අත්තිකාරම් මුදල වන රුපියල් ලක්ෂ විසි අටක මුදල අඩුකොට ගෙවීම් කටයුතු සිදුකරන බවත්, ඉතිරි වැඩ කොටස් සඳහා

නව මිල ගණන් යටතේ ඇස්තමේන්තු සකස්කොට නැවත මිල ගණන් කැඳවා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ලබා ගන්නා බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙහි ඉදිකිරීම් කටයුතු වලට අදාළ නව ඇස්තමේන්තු සහ ටෙන්ඩර් ලියකියවිලි සකස්කළ පසු ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස සභාගත කරන මෙන් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව නරාවල, සිට්ටුස්වත්තේ අප ප්‍රාදේශීය සභාව විසින් ඉදිකරනු ලබන ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීම සඳහා ගිවිසුම්ගත වූ ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනය විසින් ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ඉහළ යාම නිසා සහ ඉන්ධන සපයා ගැනීමට ඇති ගැටළු නිසා කර්මාන්තය සිදුකරගෙන යාමට නොහැකි බැවින් කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කරන ලෙස 2022-07-15 දිනැතිව කරන ලද ඉල්ලීම සලකා අදාළ කොන්ත්‍රාත් ගිවිසුම 2022-08-08 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති කමිටුවේදී (ටෙන්ඩර් කමිටුවේදී) අවලංගු කිරීමට තීරණය කළ බැවින් මෙම ද්විත්ව කුටීර අදාහනාගාරයේ ඉතිරි වැඩ කොටස් සඳහා නව මිල ගණන් යටතේ ඇස්තමේන්තු සකස්කර නැවත මිල ගණන් කැඳවා (RETENDER) අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමටත් මේ සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සකස්කිරීම, අධීක්ෂණ හා උපදේශන සේවාවන් නර්ඩ් ආයතනය හරහා ලබා ගැනීමටත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**06.** අප ප්‍රාදේශීය සභාවට ලැබෙන පෙරසැරි ගාස්තු මුදල නොඉක්මවන පරිදි සහ නාගරික සංවර්ධන අධිකාරිය මගින් සැලසුම් කමිටු පැවැත්වීම සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ වලටද අනුකූල වන පරිදි සැලසුම් කමිටුවට සහභාගිවන කමිටු සාමාජිකයන්ට ගෙවනු ලබන දීමනාව රු.2,000.00ක් දක්වා වැඩි කිරීමටත්, කා.කා.ස දීමනාව රු.1,00.00ක් දක්වා වැඩි කිරීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අප ප්‍රාදේශීය සභාවට ලැබෙන පෙරසැරි ගාස්තු මුදල නොඉක්මවන පරිදි සහ නාගරික සංවර්ධන අධිකාරිය මගින් සැලසුම් කමිටු පැවැත්වීම සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ වලටද අනුකූල වන පරිදි සැලසුම් කමිටුවට සහභාගිවන කමිටු සාමාජිකයන්ට ගෙවනු ලබන දීමනාව රු.2,000.00ක් දක්වා වැඩි කිරීමටත්, කා.කා.ස දීමනාව රු.1,000.00ක් දක්වා වැඩි කිරීමටත් ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සංශෝධනයක් ඉදිරිපත් කරන ලදී.

එම සංශෝධනය ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සැලසුම් කමිටු දීමනාව රු.2,500.00ක් දක්වා වැඩිකළ හැකි බවට නාගරික සංවර්ධන අධිකාරිය විසින් සෑම පළාත් පාලන ආයතනයක් වෙතම දැනුවත් කිරීම සිදුකොට ඇති බවත්, මේ වන විට සැලසුම් කමිටු දීමනාව ලෙස රු.1,000.00ක මුදලක් ගෙවන බවත්, ගිය සභාවාරයට මෙම යෝජනාව ඉදිරිපත් වුවද රු.2,500.00ක් දක්වා එම මුදල වැඩි කිරීමට තමා එකඟ නොවූ බවත්, එම නිසා අනෙකුත් පළාත් පාලන ආයතන වෙතින් විමසීම් සිදු කිරීමෙන් පසු සැලසුම් කමිටු දීමනාව රු.2,000.00ක් දක්වා වැඩි කිරීමට යෝජනා කළ බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සංශෝධනයක් ඉදිරිපත් කරන ලදී.

මෙම යෝජනාවේ කා.කා.ස දීමනාව රු.1,00.00ක් ලෙස සටහන් වීම නිවැරදි කළ යුතු බවට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කා.කා.ස දීමනාව රු.1,000.00ක් ලෙස සංශෝධනය කළ බවත්, සැලසුම් කමිටු දීමනාව වැඩි කළා සේම වැඩි සැලසුම් ප්‍රමාණයක් අනුමත කර දී බල ප්‍රදේශයේ ජනතාව වෙත වැඩි සේවාවක් ලබාදෙන ලෙස තමා අදාළ නිලධාරීන් වෙතින් ඉල්ලා සිටි බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී සංශෝධිත යෝජනාවට අදාළව අප ප්‍රාදේශීය සභාවට ලැබෙන පෙරසැරි ගාස්තු මුදල නොඉක්මවන පරිදි සහ නාගරික සංවර්ධන අධිකාරිය මගින් සැලසුම් කමිටු පැවැත්වීම සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ වලටද අනුකූල වන පරිදි සැලසුම් කමිටුවට සහභාගිවන කමිටු සාමාජිකයන්ට ගෙවනු ලබන දීමනාව රු.2,000.00ක් දක්වා වැඩි කිරීමටත්, කා.කා.ස දීමනාව රු.1,000.00ක් දක්වා වැඩි කිරීමටත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**(පෙ.ව 10.40ට තේ පානය සඳහා කල් තබන ලද මහා සභා රැස්වීම පෙ.ව 10.55ට නැවත ආරම්භ කරන ලදී.)**

(පෙ.ව. 10.55ට ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සහ ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා හට සහ ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා හට නිවාඩු අනුමත කිරීමට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා හට නිවාඩු අනුමත කිරීමට ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා විසින් සිදුකරන ලද යෝජනාව කිසිදු ගරු මන්ත්‍රීවරයෙකු විසින් ස්ථිර නොකරන ලදී.

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**07.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාසය කරනු ලබන ජනතාවගේ අධ්‍යාපනික, ආගමික, සංස්කෘතික සහ සදාචාරමත් සමාජයක් වෙනුවෙන් ආකල්ප සංවර්ධනය කිරීමේ වැඩසටහන් 12ක් කොට්ඨාශ මූලික කර පැවැත්වීමටත්, ඒ සඳහා පහසුකම් සැලසීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාසය කරනු ලබන ජනතාවගේ අධ්‍යාපනික, ආගමික, සංස්කෘතික සහ සදාචාරමත් සමාජයක් වෙනුවෙන් ආකල්ප සංවර්ධනය කිරීමේ වැඩසටහන් 12ක් කොට්ඨාශ මූලික කර පැවැත්වීමටත්, ඒ සඳහා පහසුකම් සැලසීමටත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**08.** පසුගිය කාලවකවානුව තුළ අප බල ප්‍රදේශයේ අධ්‍යාපනික, මහාමාර්ග, වාරිමාර්ග, දුරකථන කණු, දුරකථන කුළුණු සම්බන්ධව ඇති ගැටළු පිළිබව අදාළ ආයතනයන් දැනුවත් කළද මේ වන තෙක් විසඳුම් ලැබී නොමැති බැවින් එම ලිපිවල පිටපත් සමග අදාළ අමාත්‍යවරයා හෝ අමාත්‍යංශ ලේකම්වරයා දැනුවත් කර විසඳුම් ඉල්ලා යැවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පසුගිය කාලයේදී ගොඩකන්ද ප්‍රදේශයේ බෝගහවේල්ල ඇළ මාර්ගය, කුකුළගහ ඇළ මාර්ගය පවිත්‍ර කිරීම සහ අවදානම් සහිත දුරකථන කුළුණු ඉවත් කිරීම පිළිබඳව අදාළ ආයතන දැනුවත් කළද ඒ සම්බන්ධව අධීක්ෂණය කිරීමක් හෝ සිදුනොකළ බැවින් සම්බන්ධීකරණ කමිටුවලදීද මේ පිළිබඳව සාකච්ඡා කළ බවත්, නමුත් මෙම ගැටළු සඳහා විසඳුම් නොලැබුණ බවත්, එබැවින් මේ පිළිබඳව ආමාත්‍යංශ ලේකම්වරු දැනුවත් කරන ලෙසත්, බෝගහවේල්ල ඇළ සුද්ධ පවිත්‍ර කිරීම සම්බන්ධයෙන් අවුරුදු හතරක් තිස්සේ ඉල්ලීම් කළ බවත්, මෙම ගැටළුව නිසා බෝගහවේල්ල ප්‍රදේශයේ කුඹුරු සහ කලවිටි සුළු වර්ෂා තත්ත්වයකදී පවා ජලයෙන් යටවීම සිදුවන බවත්, මේ පිළිබඳව මාස හයෙන් හයට අදාළ ආයතනයන් වෙත ලිපි යවා ඇති බවත්, එම ලිපිවල පිටපත්ද සහිතව මෙම ගැටළු පිළිබඳව අමාත්‍යංශ ලේකම්වරු දැනුවත් කළ යුතු බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව පසුගිය කාලවකවානුව තුළ අප බල ප්‍රදේශයේ අධ්‍යාපනික, මහාමාර්ග, වාරිමාර්ග, දුරකථන කණු, දුරකථන කුළුණු සම්බන්ධව ඇති ගැටළු පිළිබව අදාළ ආයතනයන් දැනුවත් කළද මේ වන තෙක් විසඳුම් ලැබී නොමැති බැවින් එම ලිපිවල පිටපත් සමග අදාළ අමාත්‍යවරයා හෝ අමාත්‍යංශ ලේකම්වරයා දැනුවත් කර විසඳුම් ඉල්ලා යැවීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**09.** ගොඩකන්ද, සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිරිපිට අඩි 04ක පොදු මාර්ගයේ ඇති දිරාපත් වූ කොස්ගස් දෙක යාබද නිවසේ පදිංචිව සිටින චමින්ද මහතාගේ දේපලවලට හා ජීවිතවලට අනතුරුදායක ලෙස පවතින බැවින් කඩිනමින් මෙම කොස් ගස් දෙක සභා අරමුදලින් කපා ඉවත් කිරීමටත් වැයවන මුදල කොස් ගස් දෙක වෙන්දේසිකොට ලබාගැනීමට හෝ මාර්ගය සඳහා හිමිකරුවන් ඉදිරිපත් වේ නම් වැයවන මුදල ඔවුන්ගෙන් අයකර ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම කොස් ගස් දෙක කැපීම සඳහා මාර්තු මස මහා සභා රැස්වීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත්, මෙය අඩි හතරක මාර්ගයක් වන අතර පාලිත අමරවර්ධන මහතා මේ සඳහා හිමිකම් කියන බවත්, මේ සඳහා කැපුම් බලපත්‍රයක් පාලිත අමරවර්ධන මහතා විසින් ලබාගෙන ඇති බවත්, මෙම කොස් ගස් ආසන්නයේ ඇති චමින්ද මහතාගේ නිවසට හා දේපලවලට අනතුරුදායක ලෙස පිහිටා ඇති බවත්, මෙම ගස් සඳහා කැපුම් බලපත්‍රය ලබා ගැනීමට හැකියාව ලැබුණද ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍රය ලබා නොදීම හේතුවෙන් පාලිත අමරවර්ධන මහතා විසින් මෙම ගස් නොකපන බවත්, කොස් ගස් කපා සති දෙකක් ඇතුළත විරෝධතා ඉදිරිපත් නොවේ නම් පමණක් මේ සඳහා ප්‍රවාහන බලපත්‍රය ලබාගත හැකි බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත්කොට ඇති බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අනතුර ඉවත් කර ඉන්පසු මේ සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාලව ගොඩකන්ද, සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිරිපිට අඩි 04ක පොදු මාර්ගයේ ඇති දිරාපත් වූ කොස්ගස් දෙක යාබද නිවසේ පදිංචිව සිටින චමින්ද මහතාගේ දේපලවලට හා ජීවිතවලට අනතුරුදායක ලෙස පවතින බැවින් කඩිනමින් මෙම කොස් ගස් දෙක සභා අරමුදලින් කපා ඉවත් කිරීමටත් වැයවන මුදල කොස් ගස් දෙක වෙන්දේසිකොට ලබාගැනීමට හෝ මාර්ගය සඳහා හිමිකරුවන් ඉදිරිපත් වේ නම් වැයවන මුදල ඔවුන්ගෙන් අයකර ගැනීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**10.** ගිංතොට තුනී ලෑලි සංස්ථාව නැවත රජයට පවරා ගන්නා ලෙස වර්තමාන ජනාධිපතිතුමාගෙන් සහ අගමැතිතුමාගෙන් ඉල්ලා යැවීමටත්, දූෂිත තක්සේරුව පිළිබඳව පරීක්ෂණයක් සිදුකරන ලෙස යවන ලද ලිපිවල පිටපත්ද මේ සමග යොමුකරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ඉඩමෙන් කොටසක් මේ වන විට විකුණා ඇති බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාලව ගිංතොට තුනී ලෑලි සංස්ථාව නැවත රජයට පවරා ගන්නා ලෙස වර්තමාන ජනාධිපතිතුමාගෙන් සහ අගමැතිතුමාගෙන් ඉල්ලා යැවීමටත්, දූෂිත තක්සේරුව පිළිබඳව පරීක්ෂණයක් සිදුකරන ලෙස යවන ලද ලිපිවල පිටපත්ද මේ සමග යොමුකරන ලෙස මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**11.** ජස්ටින් කන්ද ප්‍රධාන මාර්ගයේ ගොඩ ගසා ඇති කාණුවෙන් ගොඩ දමන ලද පස් සභාවේ ජේ.සී.බී යන්ත්‍රය, ට්‍රැක්ටර් රථ සහ සේවකයන් යොදවා එම ස්ථානයෙන් ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගාල්ල මහමෝදර රෝහල ඉදිකළ ස්ථානයේ පිටුපස ජස්ටින් කන්දේ කාණුව අසළ මෙම පස් දමා ඇති බැවින් ළඟ පිහිටි වෙනත් ස්ථානයක් වෙත මෙම පස් ඉවත් කළ යුතු බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාලව ජස්ටින් කන්ද ප්‍රධාන මාර්ගයේ ගොඩ ගසා ඇති කාණුවෙන් ගොඩ දමන ලද පස් සභාවේ ජේ.සී.බී යන්ත්‍රය, ට්‍රැක්ටර් රථ සහ සේවකයන් යොදවා එම ස්ථානයෙන් ඉවත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**12.** කරාපිටිය, කිරිමැටිමුල්ල මාර්ගයේ අනතුරුදායක ඇල්බීසියා ගස සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදා පෙරළා දැමීමට හෝ සභා අරමුදලින් කපා ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කරාපිටිය, කිරිමැටිමුල්ල මාර්ගයේ අනතුරුදායක ඇල්බීසියා ගස සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදා පෙරළා දැමීමට හෝ සභා අරමුදලින් කපා ඉවත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>**

**13.** බෝපෙ උතුර, එගොඩකනත්ත ප්‍රජා ශාලවේ ඇති ටෙන්ට්, පුටු සහ අනෙකුත් ද්‍රව්‍ය ගබඩාකර තැබීම සඳහා ගබඩා කාමරයක් ඉදිකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ස්ථානයේ දෙමහල් ගොඩනැගිල්ලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ඉදිකිරීමට යෝජනා කළ නමුත් ප්‍රතිපාදන නොලැබුණ බැවින් එම කාර්යය සිදුකිරීමට නොහැකි වූ බවත්, මෙම ගබඩා කාමරය ඉදිකිරීමට අදාළව මීට පෙර යෝජනාවක් තමා විසින් ඉදිරිපත් කළ පසු තාක්ෂණ නිලධාරි විසින් මේ සඳහා ඇස්තමේන්තුවක් සහ සැලසුමක් සකස්කර ඇති බවත්, මෙම සමිතිය ප්‍රදේශයේ වටිනා සමිතියක් වන බැවින් එම ගබඩා කාමරය සකස්කළ යුතු බවට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ඊ) කාරක සභාවල වාර්තා ඃ-</u>**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව ඃ-**

**I.** 2022-08-08 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව ඃ-**

**I.** 2022-08-08 දින පැවති තාක්ෂණික සේවා කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව ඃ- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව ඃ- නැත**

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-</u>**

<u>01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>

2022 වර්ෂයේ ජූලි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>

2022 වර්ෂයේ ජූලි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

2022 වර්ෂයේ ජූලි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

(පෙ.ව. 11.05ට ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**04. වෙනත් ලේඛන** ඃ-

I. විදේශ නිවාඩු අනුමත කර ගැනීම සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය සහ මේ සම්බන්ධව පළාත් පාලන නියෝජ්‍ය කොමසාරිස්ගේ (ගාල්ල) 2022-06-28 දිනැති සහ පපාසකො/ගා/ආ/07/වි.නි අංක දරන ලිපිය සභාගත කරන ලදී.

**(උෟ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**2022 වර්ෂයේ අගෝස්තු මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.**

ගිංතොට, වෙදගේවත්ත මාර්ගයේ සම්පත් මහතාගේ නිවස අසළ මාර්ගයට පැති බැම්මක් කඩා වැටී මාර්ගයට හානි සිදුවිය හැකි බවට තමා වෙත ලැබුණු ලිපියක් සභාව වෙත යොමු කොට සොයා බලන ලෙස ඉල්ලීම් කළ බවත්, මේ වන විට එම මාර්ගය භාවිතා කරන ජනතාව ඒ අසළ ඉඩමක් හරහා ගමනාගමන කටයුතු සිදුකරන බැවින් මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

නව ගරු පාර්ලිමේන්තු වජිර අබේවර්ධන මැතිතුමාහට ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා විසින් සුභාසිංශන පිරිනමන ලදී.

**මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු** ඃ-

I. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
II. ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
III. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.**

මීළඟ මහා සභා රැස්වීම 2022-09-21 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීමේ කටයුතු පෙ.ව 11.10 ට අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.